**ජාතික ඩෙංගු මර්දන ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය**

தேசிய டெங்கு தடுப்பு பிரிவு, சுகாதார அமைச்சு

**National Dengue Control Unit, Ministry of Health**

+94 11 2368416 | +94 11 2368417 | +9411 2369893 | ndcu2010@yahoo.com | director.ndcu@gmail.com | www.dengue.health.gov.lk


මගේ අංකය / எனது இல / My No. } NDCU/AF/SMCC/01/2024 | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 05 -01- 2024

අධ්‍යක්ෂ (මාධ්‍ය)

සෞඛ්‍ය අමාත්‍යාංශය

**ඩෙංගු රෝග වැළැක්වීම සහ පාලනයට අදාළ මහජන ඇමතුම් සඳහා ක්ෂණික ඇමතුම් අංකයක් ස්ථාපිත කිරීම**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමා 2024 ජනවාරි මස 03 දින පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ නාවික සහ ගුවන් මෙහෙයුම් අංශයේ කපිතාන් ඩී. ඒ. එදිරිවීර සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන ඇතුළු සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සමග ඩෙංගු රෝගය පාලනය කිරීම පිළිබඳ ව පැවැත්වූ සාකච්ඡාවක දී එළැඹි තීරණයක් අනුව ඩෙංගු රෝගය පිළිබඳ තොරතුරු දැන ගැනීමට හෝ ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන පිළිබඳ දන්වා සිටින මහජන ඇමතුම් සඳහා ක්ෂණික ඇමතුම් අංකයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා පෙර සූදානම් සහ ප්‍රතිචාර දැක්වීමේ ඒකකයේ අද දින සිට ස්ථාපිත කර ඇත. මෙම ක්ෂණික අංකය වන්නේ 011-7966 366 ය. මෙම අංකය සෑම දිනක ම (සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින ඇතුළුව) පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වා විවෘත ව පවතී.

ක්ෂණික ඇමතුම් සේවය මගින් ඩෙංගු රෝගය පිළිබඳ ව විමසා සිටින අවස්ථාවල දී එම තොරතුරු සැපයීම ද වෙනත් සේවා හෝ පාරිසරික ප්‍රශ්නයක් සම්බන්ධව නම් එම කටයුතු වලට වහා ම අවධානය යොමු කර අවශ්‍ය පියවර ගැනීමට අදාළ අංශ වෙත දන්වා සිටීම ද සිදු කරනු ලැබේ.

මෙම ක්ෂණික ඇමතුම් සේවය පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ගේ කාර්යාලයේ සහාය ද ලබා දී ඇත.

ඉහත තොරතුරු විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට කටයුතු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමි. හැකියාවක් තිබේ නම් රූපවාහිනී තිරය මත දිස්වන කෙටි පණිවුඩයක් (TRAILER) ලෙස පහත දැක්වෙන කරුණු ප්‍රචාරය කරන්නේ නම් සුදුසු ය.

> ඩෙංගු රෝගය පිළිබඳ තොරතුරු දැන ගැනීමට හෝ ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන පිළිබඳ ව දැන්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්ෂණික ඇමතුම් අංක 011 7966 366 අමතන්න.
>
> දිනපතා උදේ 8.00 සිට රාත්‍රී 8.00 දක්වා විවෘතයි

ස්තූතියි,

වෛද්‍ය සුදත් සමරවීර
අධ්‍යක්ෂ

වෛද්‍ය සුදත් සමරවීර
අධ්‍යක්ෂ
ජාතික ඩෙංගු මර්දන ඒකකය